# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/205/2019 (NPC)**

මිල්රෝයි අනුර ඩයස් ගුණවර්ධන

**අභියාචක**

**එදිරිව**

**ජාතික පොලිස් කොමිසම**

**වගඋත්තරකරු**

දිනය :- **2025.06.05**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක පෞද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නීතිඥ ටී.කේ.ආර්.පී ජයතුංග මෙනවිය සමග සහකාර අධ්‍යක්ෂක ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

<u>විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා</u>

**-<u>නියෝගය</u>-**

අභියාචක මිල්රෝයි අනුර ඩයස් ගුණවර්ධන නැමැති අය විසින්, **2019.09.13** දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනය මත මෙම පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. එකී අභියාචනය මගින් ඔහු ඉල්ලා ඇත්තේ, **2008.07.08** දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙසත්, ඉන් අනතුරුව ඔහුට හිමි සියලු වැටුප් හා වැටුප් වර්ධක ගෙවන ලෙසත් ය.

ඉහත සඳහන් සේවය අත්හැරයාමේ නියෝගය නිකුත් කර ඇත්තේ, හම්බන්තොට සහකාර පොලිස් අධිකාරීගේ **2009.03.02** දිනැති ලිපිය මගිනි. එහි සඳහන් කර ඇත්තේ, නිසි අවසරයකින් හෝ අනුමැතියක් නොමැතිව **2008.07.03** දින සිට අභියාචක සේවයට වාර්තාකර නොමැති බවයි.

ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති **2020.01.21** දිනැති විරෝධතාවල සහ පසුව ඉදිරිපත් කල දේශන වල සඳහන් කර ඇත්තේ, මෙම කරුණ සම්බන්ධයෙන් ම මෙම අභියාචකට එරෙහිව මෙම විනිශ්චය අධිකාරය විසින් **2009.09.15** දින තීරණයක් ලබාදී ඇති බවයි. එම තත්ත්වය තහවුරු කරමින්, ජාතික පොලිස් කොමිෂම් සභාව විසින් නැවත වරක් **2022.01.18** දිනැති වාර්තාව ඉදිරිපත් කර ඇත. ඊට අමතරව නැවත වරක් **2025.02.10** වෙනි දින දී ද වාර්තා ඉදිරිපත් කරමින් මූලික විරෝධතා ලෙස එම කරුණම ඉදිරිපත් කරමින්, මෙම විනිශ්චය අධිකාරය විසින් දැනටමත්

තීරණයක් ලබාදී ඇති නිසා, ඒ සම්බන්ධයෙන් නැවත සළකා බැලීමට මෙම විනිශ්චය අධිකාරයට බලයක් නොමැති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

ඉහත කී තත්ත්වය මත මේ සම්බන්ධයෙන් පැවති අංක AAT/190/2008(NPC) දරණ නඩු වාර්තාව පරීක්ෂා කර බලන ලදි. එම අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ මෙම අභියාචක වන එම්.ඒ.ඩී.ගුණවර්ධන යන අයගේ 2008.12.20 දිනැති අභියාචනා පෙත්සම මගිනි. එම අභියාචනයේ ශීර්ෂ පාඨයේ සඳහන් කර ඇත්තේ, එය, 2008.12.15 වෙනි දින ඔහු වෙත ලැබුණ පොලිස් කොමිෂන් සභාවේ නියෝගයට එරෙහිව කරනු ලබන අභියාචනයක් ලෙස බවයි. එම අභියාචනයේ 06 වන ඡේදයේ සඳහන් කර ඇත්තේ, ඉහත කී 2008.12.15 වෙනි දින නිකුත් කරන ලද නියෝගයට එරෙහිව එම අභියාචනය ඉදිරිපත් කරන බවයි.

දැනට විභාග වන මෙම අභියාචනා පෙත්සමේ ඉල්ලා ඇති සහනය වන්නේ 2008.07.08 දින සිට ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙසටය. ඉහත කි 190/2008(NPC) දරණ අභියාචනයේ 06 වන ඡේදයේ සඳහන් කර ඇත්තේ ද, 2008.12.15 දිනැති නියෝගය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇත්තේ, අභියාචක 2008.07.08 දින සිට අභියාචක සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් බවයි. ඉහත කී පරිදි 2008.07.08 දින සිට අභියාචක සේවයට වාර්තා නොකළ බව, හම්බන්තොට සහකාර පොලිස් අධිකාරී විසින් අභියාචක වෙත යවන ලද 2009.03.02 දිනැති ලිපියේ ද පැහැදිලි ව සඳහන් කර ඇත.

ඉහත කරුණු සියල්ල සළකා බලන විට පෙනී යන්නේ ඉහතින් සඳහන් කරන ලද, 2009.03.02 දිනැතිව, අභියාචක වෙත නිකුත් කරන ලද සේවය හැරයාමේ නිවේදනය සම්බන්ධයෙන් මෙම විනිශ්චය අධිකාරයේ අංක 190/2008(NPC) දරණ නඩුව පවරා පවත්වා ගෙන ගොස් ඇති බවයි. එම අභියාචනය සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් විමසීමට ලක්කිරීමෙන් අනතුරුව 2009.09.15 වෙනි දින ඒ සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක නඩු තීන්දුවක් ප්‍රකාශයට පත්කර ඇත.

එයින් පෙනී යන්නේ මෙම අභියාචක විසින් එකම කරුණ සම්බන්ධයෙන් මෙම අභියාචනාව දෙවන වරටද මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති බවයි. ප්‍රථම අභියාචනය විමසීමට ලක් කිරීමෙන් අනතුරුව තීන්දුව ප්‍රකාශයට පත්කර ඇති නිසා, ඒ සම්බන්ධයෙන් නැවත සළකා බැලීමට මෙම විනිශ්චය අධිකාරයට බලතල ලැබෙන්නේ නැත. ඒ අනුව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2019.09.13 දින අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

කෙසේ වුවද, මෙම කරුණ අවසන් වතාවට විමසීමට ගත් අවස්ථාවෙන් පසුව, අභියාචක විසින් කරුණු ඉදිරිපත් කරමින් ලිඛිත දේශනයක්, 2025.04.10 වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ගොනු කර ඇත. එහි කිසිදු ස්ථානයක ඔහුගේ සේවය නැවත ලබාදෙන ලෙසට ඉල්ලා නැත. එහි සඳහන් කර ඇත්තේ, ඔහුට විශ්‍රාම තත්ත්වයක් ලබාදෙන ලෙසයි.

නමුත් විශ්‍රාම තත්ත්වයක් ලබාදීම සඳහා ප්‍රථමයෙන්ම සළකා බැලිය යුතු වන්නේ, අදාළ නිලධාරියා කොපමණ කාල පරිච්ඡේදයක් සක්‍රිය සේවයේ නියුක්තව සිටියේද යන්නයි. එවැනි කරුණු කිසිවක් එකී 2025.04.10 දිනැති ලේඛනයේ සඳහන් කර නැත. එහි සඳහන් කර ඇත්තේ ඔහුගේ වයස අවුරුදු 57ක් බවත්, ඔහුගේ එකම දරුවා රැකියාවක් නොකර ඉගෙනීම් කටයුතු වල නිරත වන බවත්, බිරිඳට රැකියාවක් නොමැති අතර, බලවත් ආර්ථික අපහසුතාවයන්ට මුහුණ පා සිටිනු ලබන බවත්ය. එවැනි කරුණු විශ්‍රාම වැටුපක් සඳහා අදාළ කරගත හැකි කරුණු නොවේ. විශ්‍රාම වැටුපක් හිමිවිය යුත්තේ කුමන පදනමක් යටතේද යන්න විශ්‍රාම වැටුප් සංග්‍රහයේ සඳහන් කර ඇත.

ඉහතින් සඳහන් කරන ලද ලේඛන වල, කුමන කාල පරිච්ඡේදයක් තුළ ඔහු සේවයේ යෙදී සිටියාද යන්න පැහැදිලි කරමින් විස්තර කර නැත. මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ, මෙම අභියාචක වෙත දෙවතාවක්ම සේවය අතහැරයාමේ නියෝග නිකුත් කර තිබීමයි.

මෙම තත්ත්වය යටතේ අභියාචක ඉල්ලා ඇති පරිදි විශ්‍රාම වැටුප ලබා දිම සම්බන්ධයෙන් වන කරුණ සළකා බලමින් ඒ අනුව නියෝගයක් ලබාදීමට ද හැකියාවක් ලැබෙන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-